මාඕ සේ-තුං

“ග්‍රාමීය සමීක්ෂණ”යට පෙරවදන හා පසුවදන

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: ''ග්‍රාමීය සමීක්ෂණ''යට පෙරවදන හා පසුවදන
කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
පිටු ගණන: 9
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE

මාඕ සේ-තුං

"ග්‍රාමීය සමීක්ෂණ"යට පෙරවදන හා පසුවදන

ප්‍රජා ප්‍රකාශකයෝ
කොළඹ 1966

ප්‍රථම මුද්‍රණය 1966 පෙබරවාරි

කොළඹ 10 ජයන්ත වීරසේකර මාවතේ අංක 19 දරණ තැන ප්‍රජා ප්‍රකාශකයෝ සමාගමේ සේවයේ නියුක්ත මීගොඩ පතිරණගේ දයානන්ද (මුද්‍රණ ශිල්පියා) විසින් එම ස්ථානයේ පිහිටි ප්‍රජා මුද්‍රණාලයේ මුද්‍රණය කරනලදුව ප්‍රජා ප්‍රකාශකයෝ (ප්‍රකාශකයා) විසින් ප්‍රසිද්ධ කරනලදී.

පෙරවදන

LIBERATIONBASE

1941, මාර්තු 17

පක්ෂයේ වර්තමාන ග්‍රාමීය ප්‍රතිපත්තිය දස අවුරුදු සිවිල් යුද්ධය පැවති කාලයේදී මෙන් ඉඩම් ලබාගැනීමේ විප්ලවය පිළිබඳ එකක් නො වේ; ජපානයට විරුද්ධ ජාතික එක්සත් පෙරමුණ සඳහා ග්‍රාමීය ප්‍රතිපත්තියකි. මුළු පක්ෂය ම 1940 ජූලි 7 වැනි ද හා දෙසැම්බර් 25 වැනි ද මධ්‍යම කාරකසභාවේ නිර්දේශයන්[1] ද, ළඟදී පවත්වන්නට යන හත්වැනි ජාතික සම්මේලනයේ නිර්දේශයන් ද ක්‍රියාවේ යෙදිය යුතු ය. මතු දක්වන කරුණු ප්‍රසිද්ධ කරන්නේ ප්‍රශ්න හැදෑරීමට ක්‍රමයක් සොයාගැනීම පිණිස සහෝදරවරුන්ට ආධාර කරනු වස් ය. අපේ සහෝදරවරුන් අතුරෙන් බොහෝ දෙනා තවම ත් වැඩ කරන්නේ රළු, නොසැලකිලිමත් අන්දමකට ය; ඔව්හු ඒ ඒ දේ හොඳහැටි අවබෝධ කරගැනීමට නො සොයති; පහළ මට්ටම් වල තත්වයන් ගැන සම්පූර්ණයෙන් ම නො දන සිටිනවා විය හැකි නමුත්, වැඩ විධානය කිරීම ගැන ඔව්හු වගකීම් බාර ව සිටිති. මෙය කටයුතු පවත්නා අතිශයින් ම භයානක තත්වයකි. චීන සමාජයේ පංක්තීන්ගේ නියම තත්වයන් පිළිබඳ ඇත්ත වශයෙන් ම වාස්තුවික දැනුමක් නොමැති ව ඇත්ත වශයෙන් ම හොඳ නායකත්වයක් තිබිය නො හැකි ය.

තත්වයන් දැනගැනීමට ඇති එක ම මග සමාජය පිළිබඳ විමංසනයන් කිරීම ය, සැබෑ ජීවිතයේ එක් එක් සමාජ පංක්තිය පිළිබඳ විමංසනයන් කිරීම ය. වැඩ විධානය කිරීම බාර ව සිටින්නන් සඳහා, තත්වයන් දැනගැනීමට ඇති ඉතා ම මූලික ක්‍රමය සැලැස්මක් අනුව නගර හා ගම් කීපයක් කෙරෙහි සිත යොමුකොට, මාක්ස්වාදයේ පදනම් දෘෂ්ටිකෝණය, එනම් පංක්ති විග්‍රහය පිළිබඳ ක්‍රමය, යොදා පරිපූර්ණ විමංසනයන් ගණනක් කිරීම ය. චීනයේ සමාජ ප්‍රශ්න පිළිබඳ ඉතා ම මූලික දැනුමක් හෝ අප විසින් ලබාගත හැක්කේ එලෙස පමණකි.

මේ දෙය කරන්නට, පළමුකොට, ඔබගේ ඇස් පහළට යොමු කරන්න, ඔබගේ හිස් උස් කොට තබාගෙන, අහස දෙස නො බලන්න. යම්කිසිවකු තම ඇස් පහළට හරවන්නට උනන්දුවක් ඇති කරගන්නා තුරු, එසේ කිරීමට අධිෂ්ඨාන සහගත වන තුරු, ඔහුට ඔහුගේ මුළු ජීවිතයේදී වත් චීනයෙහි ඒ ඒ දේ ඇත්ත වශයෙන් තේරුම්ගන්නට කිසි කලෙක බැරි වේ.

දෙවැනි ව, සත්‍ය කරුණු සෙවීමේ රැස්වීම් පවත්වන්න. සත්තකින් ම, හුදෙක් ඒ මේ අත බැලීමෙන් වත් කටකතා වලට කන්දීමෙන් වත් බහුශ්‍රැත දැනුමක් ලබාගත නො හැකි ය. සත්‍ය කරුණු සෙවීමේ රැස්වීම් මගින් මා ලබාගත් දත්ත අතුරෙන්, හුනාන් පළාත ගැන ත් චිංකාංශාන් ගැන ත් වූ දත්ත නැති වී ය. මෙහි පළකරන කරුණු ප්‍රධාන වශයෙන් "ශිංකුඕ පිළිබඳ සමීක්ෂණය," "වාංකාං ශියාං පිළිබඳ සමීක්ෂණය" සහ "ත්සායිශි ශියාං පිළිබඳ සමීක්ෂණය" යන දෙයින් සමන්විත ය. සත්‍ය කරුණු සෙවීමේ රැස්වීම් පැවැත්වීම ඉතාමත් ම සරල, ඉතාමත් ම ප්‍රායෝගික සහ ඉතාමත් ම විශ්වාස කටහැකි ක්‍රමය, මා බොහෝ කොට ප්‍රයෝජන ලබාගත් ක්‍රමයක්, වේ; එය කවර විශ්වවිද්‍යාලයකට ත් වඩා හොඳ පාසලකි. එබඳු රැස්වීම් වලට සහභාගි වන අය ඇත්ත වශයෙන් ම අත්දැකීම් ඇති මධ්‍යම සහ පහළ ශ්‍රේණීන්ට අයත්

කාඩර්වරුන් හෝ සාමාන්‍ය මිනිසුන් විය යුත්තාහ. හුනාන් පළාතේ කෝරළ පහක සහ චිංකාංශාන්හි කෝරළ දෙකක මා කළ විමංසනයන්හිදී මා ගියේ මධ්‍යම ශ්‍රේණියට අයත් වගකිවයුතු කාඩර්වරුන් වෙත ය; ශූන්වූ විමංසනයේදී මම මධ්‍යම හා පහළ ශ්‍රේණීන්ට අයත් කාඩර්වරුන්, දිළිඳු ශියුත්සායි[2] කෙනකු, වෙළඳ මණ්ඩලයක සභාපති ව සිට බංකොලොත් ලැබූවකු සහ කෝරළ ආදායම් බාර සුළු නිලධාරියකු ව සිට රක්සාව නැතිවූවකු වෙත ගියෙමි. මේ මිනිසුන් සියලු දෙනා ම මා කිසි කලෙක අසා වත් නො තිබුණු තොරතුරු මහත් රැසක් මට දුන්හ. චීන සිරගෙවල් වල අන්ත දූෂිතභාවය පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් පළමුවැනි වරට මට දුන් මිනිසා හුනාන් පළාතේ හෙංශාන් කෝරළයෙහි මගේ විමංසනය කරගෙන යද්දී මට මුණගැසුණු සුළු හිරගෙදර–මුළාදෑනියෙකි. ශිංකුඕ කෝරළය සහ වාංකාං ද ත්සායිශි ශියාං ද පිළිබඳ මගේ විමංසනයන්හිදී, මම ශියාං මට්ටමේ වැඩකරන සහෝදරවරුන් හා සාමාන්‍ය ගොවීන් වෙත ගියෙමි. මේ කාඩර්වරුන්, ගොවීන්, ශියුත්සායි, හිරගෙදර – මුළාදෑනියා, වෙළෙන්ද සහ ආදායම් ලිපිකරු යන සියල්ලෝ ම මගේ සම්භාවනීය ගුරුවරු වූහ; ඔවුන්ගේ ගෝලයා වශයෙන් මගේ ආකල්පයේදී ගරුසරු සහ අනලස් වන්නට ද සහෝදරාත්මක වන්නට ද මට සිදුවිය; නො එසේ නම්, ඔවුන් මා ගැන සැලකිල්ලක් නො දක්වන්–නට ඉඩ තිබුණි; ඔවුන් දැන සිටියත්, කතා නො කරන්නට ඉඩ තිබුණි; නැතහොත්, ඔවුන් කතා කළත්, ඔවුන් දැන සිටි සියල්ල නො කියන්නට ඉඩ තිබුණි. සත්‍ය කරුණු සෙවීමේ රැස්වීමක් විසාල වන්නට උවමනා නැත; මිනිසුන් තුන් දෙනකුන්ගේ සිට පස් දෙනකුන් හෝ හත් දෙනකුන් හෝ අට දෙනකුන් තෙක් සිටිතොත් ඇත. ඕනෑ තරම් කාලය දිය යුතු ය, විමංසනය පිණිස කටුසට–හනක් පිළියෙළ කළ යුතු ය; එමතු නො ව, අයෙක් පුද්ගලික ව ම ප්‍රශ්න ඇසිය යුතු ය, සටහන් ගත යුතු ය, රැස්වීමේ සිටින අය සමග සාකච්ඡා කළ යුතු ය. එහෙයින් හදවත පිරිතිරි ගිය උද්‍යොගය නොමැති ව, අයකුගේ ඇස් පහළට යොමු කිරීමට අධිෂ්ඨානයක්

නොමැති ව, දැනුම ලබා ගැනීමට පවස නොමැති ව, උජාරු බවේ ලෝගුව ගලවා දමා කැමැත්තෙන් ම ශිෂ්‍යයකු නො වී, විමංසනයන් කිරීමට, හෝ එය හොඳින් කිරීමට, අයකුට සත්තකින් ම නො හැකි ය. අප බොහෝ විට ළාමක හා මෝඩ වන අතර, සැබෑ වීරයන් වන්නේ බහුජනතාව බව තේරුම් ගත යුතු ව ඇත; මේ කරුණ තේරුම් ගන්නා තුරු ඉතා ම මූලික දැනුම පවා ලබා ගත නො හැකි ය.

මේ ආශ්‍රය කරුණු පළකිරීමේ ප්‍රධාන අදහස පහළ මට්ටම් වල පවත්නා තත්වයන් සොයා දැනගැනීමේ ක්‍රමයක් පෙන්වාදීම බව යළි ත් කීමට මම කැමැත්තෙමි; ඒ ඒ විශේෂිත කරුණු ත් ඉන් බසින නිගමන ත් සහෝදරවරුන් විසින් කටපාඩම් කිරීම අදහස නො වේ. පොදුවේ කතා කරන කල, සමාජ තත්වයන් ගැන, යුරෝපයෙහි, ඇමරිකාවෙහි සහ ජපානයෙහි ධනේශ්වරපංක්තිය කර තිබෙන්නාක් මෙන්, සංසන්දනාත්මක වශයෙන් විස්තීර්ණ වූ, හෝ මූලික වූ පවා, කරුණු සපයන්නට චීනයේ ළදරු ධනේශ්වර-පංක්තිය මෙතෙක් සමත් වී නැත, කිසි කලෙක සමත් වන්නේ ත් නැත; එහෙයින් අප විසින් ම එය රැස් කරගැනීම විනා කළ හැකි අන් දෙයක් අපට නැත. වෙසෙසා කතා කරන කල, ප්‍රායෝගික වැඩ වල යෙදී සිටින අය සැම විට ම වෙනස් වන තත්වයන් දැනගෙන සිටිය යුතු ය; මෙය කවර රටක වේවා කිසි ම කොමියුනිස්ට් පක්ෂයක් අන්‍යයන් කෙරෙහි බලාපොරොත්තුව තබා නො සිටිය හැකි දෙයකි. එහෙයින්, ප්‍රායෝගික වැඩ වල යෙදී සිටින හැම අයෙක් ම පහළ මට්ටම් වල පවත්නා තත්වයන් විමසා බැලිය යුතු ය. එවැනි විමංසනයක් න්‍යායය පමණක් දන්නා, එහෙත් නියම තත්වයන් නො දන්නා අය හට වෙසෙසින් අවශ්‍ය ය; නො එසේ නම් න්‍යායය භාවිතය සමග ඈඳන්නට ඔවුන් අසමත් වෙනවා ඇත. ''විමංසනය කළේ නැත් නම්, කතාකරන්නට අයිතියක් නැත'' යන මගේ සවිර ප්‍රකාශය ''පටු ප්‍රත්‍යක්ෂවාදය'' වශයෙන් පරිහාසයට ලක් කරනලද්දේ වී නමුදු, ඒ ප්‍රකාශය කිරීම

ගැන මම අද වන තුරු ත් පසුතැවිලි නො වෙමි; එපමණක් නො වේ, විමංසනය නොමැති ව කතා කිරීමට කිසි අයිතියක් නො තිබිය හැකි බව මම තවම ත් තරයේ කියා සිටිමි. ''නිල රථයෙන් බැස්ස මොහොතේ ම'' මහ කලබලයක් කරන, අදහස් කියාගෙන කියාගෙන යන, මේක විවේචනය කරන අරෙක හෙළාදකින බොහෝ මිනිස්සු සිටිති; එහෙත්, ඇත්ත වශයෙන්, එබඳු මිනිසුන් දහ දෙනකුන් ගෙන් දහ දෙනෙකුන්ට ම හමුවන්නේ ව්‍යර්ථභාවය යි. හොඳහැටියට කළ විමංසනය පදනම නො කර ගත් ඒ විධියේ අදහස් හෝ විවේචන මෝඩ අනම්මනම් විනා අන් කිසිවක් නො වන නිසා ය. අතන මෙතන හැම තැන ම දුව පැන ඇවිද්ද මේ ''අධිරාජ නියෝජිතයන්'' අතින් අපේ පක්ෂය පීඩාවට පත් වූ වාර ගණන් නැත. ''න්‍යායය, විප්ලවවාදී භාවිතය සමග සම්බන්ධ නො කරනලද නම්, නිරර්ථක වන්නේ ය,''යි ස්ටැලින් නිවැරදි ව කියයි. ''භාවිතය, එහි මග විප්ලවවාදී න්‍යායයෙන් ආලෝකමත් නො කරනලද නම්, අඳුරේ අතපතගාමින් ගමන් කරන්නේ ය,''[3]යි ඔහු නිවැරදි ව තවදුරට ත් කියයි. අඳුරේ අතපතගාමින් ගමන් කරන, අනාගත බලාපොරොත්තුවක් නැති, දුරදිග නො පෙනෙන ''ප්‍රායෝගික මිනිසා'' හැර අන් කිසිවකු ''පටු ප්‍රත්‍යක්ෂවාදියා''යි හංවඩු නො ගැසිය යුතු ය.

අද චීන සහ ලෝක කටයුතු තුළට ම යමින් තරයේ විමසා බැලීමේ අවශ්‍යතාව මට තවම ත් තියුණු ලෙස දැනෙයි; මෙය චීන හා ලෝක කටයුතු පිළිබඳ මගේ ම දැනුමේ අල්පභාවයට සම්බන්ධ ය; මා සියල්ල දන්නවා ය, අනික් අය දන්නේ නැත යන අදහසක් එයින් නො අඟවයි. පක්ෂයේ සෙසු සියලු සහෝදරවරුන් සමග එක්ව, බහුජනතාව ගෙන් ඉගෙනගනිමින්, දිගට ම ශිෂ්‍යයකු වී සිටීම මගේ කැමැත්ත ය.

LIBERATIONBASE

පසුවදන

1941, අප්‍රේල් 19

දස අවුරුදු සිවිල් යුද්ධය පිළිබඳ වකවානුවේ අත්දැකීම වර්තමාන වකවානුවට. ජපානයට විරුද්ධකම් පෑමේ යුද්ධයට, ඉතා ම හොඳ සහ ඉතා ම උචිත අත්දැකීම ය. එහෙත් මෙය අදාළ වන්නේ අප බහුජනතාව සමග ඈඳෙන්නේ ත් ඔවුන් සතුරාට විරුද්ධ ව ක්‍රියාකාරිභාවයට පත් කරන්නේ ත් කෙසේ ද යන අංගයට ය, උපාය මාර්ගය පිළිබඳ අංගයට නො වේ. පක්ෂයේ වර්තමාන උපාය මාර්ගය මූලික ප්‍රතිපත්තිය අතින් අතීතයේ උපාය මාර්ගයට වෙනස් ය. පෙරදී, පක්ෂයේ උපාය මාර්ගය වූයේ ඉඩම්හිමියන්ට සහ ප්‍රති-විප්ලවවාදි ධනේශ්වරපංක්තියට විරුද්ධ වීම ය; දැන් එය ජපානයට විරුද්ධකම් පෑමට විරුද්ධ නො වන සියලු ඉඩම්හිමියන් සහ ධනේශ්වරපංක්තියේ සාමාජිකයන් සමග එක්සත් වීම ය. දස අවුරුදු සිවිල් යුද්ධයේ පශ්චිම අවධියේදී පවා, එක් අතකින් අපට සන්නද්ධ ප්‍රහාරයන් දෙමින් සිටි ප්‍රතිගාමී ආණ්ඩුව හා දේශපාලන පක්ෂය කෙරෙහි ද, අනික් අතින් අපේ ම පාලනය යටතේ සිටි ධනවාදි ලක්ෂණයකින් යුත් සියලු සමාජ තට්ටු කෙරෙහි ද වෙනස් ප්‍රතිපත්ති ඇසුරු නො කිරීම වැරදි විය; ප්‍රතිගාමී ආණ්ඩුව හා දේශපාලන පක්ෂය තුළ සිටි විවිධ කණ්ඩායම් කෙරෙහි වෙනස් ප්‍රතිපත්ති ඇසුරු නො කිරීම ද වැරදි විය. ඒ කාලයෙහි,

ගොවිජනතාව ත් නාගරික සුළු ධනේශ්වරපංක්තියේ පහළ තට්ටු ත් හැර සමාජයේ හැම කොටසක් කෙරෙහි ''සියල්ල ම අරගලය'' පිළිබඳ ප්‍රතිපත්තියක් අනුගමනය කරනලදි; මේ ප්‍රතිපත්තිය නිසැක-යෙන් ම වැරදි විය. ඉඩම් ලබාගැනීමේ ප්‍රතිපත්තියේදී ත්, ඉඩම් හිමියන්ට ත් ගොවිතැනෙහි යෙදෙන්නට හැකි වන සේ ද ඔවුන්ට තැනක් නැති නො වන සේ සහ ඔවුන් පල්හොරුන් වශයෙන් කඳුකරයන්ට ගොස් මහජන සාමය අවුල්පවුල් නො කරන සේ ද, ගොවීන්ට දුන් තරම් ම ඉඩම් කොටසක් ඔවුන්ට දුන්, දස අවුරුදු සිවිල් යුද්ධයේ මුල් හා මැද අවධීන්හි ඇසුරු කළ නිවැරදි ප්‍රතිපත්තිය අත්හැර දැමීම ද වැරදි විය. පක්ෂයේ ප්‍රතිපත්තිය දැන් අවශ්‍ය නිසා ම වෙනස් එකකි; එය ''සියල්ල ම අරගලය සහ කිසි ම සන්ධානයක් නැත'' යන්න වත්, (1927තේ වෙන් තු-ශියුවාදය මෙන්) ''සියල්ල ම සන්ධානය සහ කිසි ම අරගලයක් නැත'' යන්න වත් නො වේ. ඒ වෙනුවට, එය ජපන් අධිරාජ්‍යවාදයට විරුද්ධ සියලු සමාජ තට්ටු සමග සමගි වීමේ, මේ තට්ටු සමග එක්සත් පෙරමුණක් තැනීමේ ද, එසේ ද වුව ඔවුන්ට විරුද්ධ ව අරගලයන් කිරීමේ, සතුරාට යටත් වීමෙහි ලා ත් කොමියුනිස්ට් පක්ෂයට සහ ජනතාවට විරුද්ධ වීමෙහි ලා ත් ඔවුන්ගේ වැනෙන-සුළුබව හා ප්‍රතිගාමී පැත්ත ප්‍රකාශයට පත්වන විවිධ ප්‍රමාණයන්ට අනුව ආකාරයෙන් වෙනස් වන අරගලයන් කිරීමේ ද ප්‍රතිපත්තියක් වේ. වර්තමාන ප්‍රතිපත්තිය ''සන්ධානය'' ත් ''අරගලය'' ත් සංයුක්ත කරන යුග්ම ප්‍රතිපත්තියකි. කම්කරු ප්‍රතිපත්තියේදී, එය කම්කරුවන්ගේ දිවිපෙවෙත උචිත ලෙස දියුණු කිරීමේ ත් ධනවාදී අර්ථක්‍රමයේ උචිත වර්ධනයට අවහිර නො කිරීමේ ත් යුග්ම ප්‍රතිපත්තිය වේ. ඉඩම් ලබාගැනීමේ ප්‍රතිපත්තියේදී, එය බදු සහ පොලී අඩු කරන ලෙස ඉඩම්හිමියන්ට බලකර කියා සිටීමේ ද, මේ අඩු කළ බදු සහ පොලී ගොවීන් විසින් ගෙවිය යුතු ය'යි නියම කිරීමේ ද යුග්ම ප්‍රතිපත්තිය වේ. දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ පරිමණ්ඩලයෙහි, එය කම්කරුවන්ට හා ගොවීන්ට දෙන තරම් ම පුද්ගල හා දේපොළ අයිතීන් සියලු ජපන්-

LIBERATIONBASE

විරෝධී ඉඩම්හිමියන්ට ත් ධනපතීන්ට ත් දීමේ ද, එසේ ද වුව, ඔවුන් විසින් කරන්නට ඉඩ තිබෙන ප්‍රති-විප්ලවවාදී වැඩකටයුතු වලට එරෙහි ව පරෙස්සමෙන් සිටීමේ ද යුග්ම ප්‍රතිපත්තිය වේ. රජය–සතු සහ සමුපකාර අර්ථක්‍රමය වර්ධනය කළ යුතු ය; එහෙත් අද ග්‍රාමීය කඳවුරු ප්‍රදේශයන්හි ප්‍රධාන ආර්ථික කවබණ්ඩය සමන්විත වන්නේ රජයේ ව්‍යාපාරයන් ගෙන් නො ව පෞද්ගලික ව්‍යාපාරයන් ගෙන් ය; අපේ අර්ථක්‍රමයෙහි නිර්-ඒකාධිකාරි ධනවාද කවබණ්ඩයට වර්ධනය වීමට ඉඩප්‍රස්තාවක් දිය යුතු ය, එය ජපන් අධිරාජ්‍යවාදයට සහ අර්ධ-රදළ ක්‍රමයට විරුද්ධ ව පාවිච්චි කළ යුතු ය. මෙය අද චීනය සඳහා ඉතා ම විප්ලවවාදී ප්‍රතිපත්තිය යි; එය ක්‍රියාත්මක කිරීමට විරුද්ධ වීම හෝ බාධා කිරීම නිසැක–යෙන් ම වරදකි. පක්ෂ සාමාජිකයන්ගේ කොමියුනිස්ට් පවිත්‍රතාව මහත් ඕනෑකමින් සහ ස්ථිර ලෙස ආරක්ෂා කිරීම ත් සමාජ අර්ථක්‍රමයේ ධනවාදී කවබණ්ඩයේ ප්‍රයෝජනවත් කොටස රැකීම සහ උචිත ලෙස වර්ධනය වීමට ඊට හැකි කිරීම ත් යන මේ දෙක ම ජපානයට විරුද්ධකම් පෑමේ සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ගොඩනැඟීමේ වකවානුවේදී අප හට නො කර ම බැරි කර්තව්‍යයෝ වෙති. මේ වකවානුවේදී ඇතැම් කොමියුනිස්ට්වාදීන් ධනේශ්වර–පංක්තිය විසින් දූෂණය කරනු ලැබීමට ත් ධනවාදී අදහස් පක්ෂයේ සාමාජිකයන් අතර පැනනැඟීමට ත් ඉඩ ඇත්තේ ය; අපි මේ පිරිහුණු අදහස් වලට විරුද්ධ ව සටන් කළ යුත්තෙමු; එසේ ද වුව, අපි පක්ෂය තුළ ධනවාදී අදහස් වලට විරුද්ධ ව කරන අරගලය වැරදි ලෙස සමාජ අර්ථක්‍රමය පිළිබඳ ක්ෂේත්‍රයට ගෙනයමින්, අර්ථක්‍රමයේ ධනවාදී කවබණ්ඩයට විරුද්ධ නො විය යුත්තෙමු. අපි ඒ දෙක අතර පැහැදිලි වෙන් කිරීමේ ඉරක් ඇඳිය යුත්තෙමු. චීනයේ කොමියුනිස්ට් පක්ෂය වැඩ කරගෙන යන්නේ ව්‍යාකූල වටාපිටාවක් තුළ ය; හැම පක්ෂ සාමාජිකයෙක් ම, වෙසෙසින් හැම කාඩර්කෙනෙක් ම, මාක්ස්වාදී උපායයන් වැටහෙන සටන්කරුවකු වීමට තමා පණපොවා ගත යුතු ය. ප්‍රශ්න කෙරෙහි එක පැත්ත–කට සීමා වූ, පමණට වඩා සුළු කොට ගත් යොමුවීමකට විප්ලවය ජයග්‍රහණය කරා ගෙනයන්නට කිසි කලෙක බැරි වේ.

LIBERATIONBASE

සටහන්

1. මධ්‍යම කාරකසභාවේ 1940 ජූලි 7 වැනි දින නිර්දේශය "වර්තමාන තත්වය සහ පක්ෂයේ ප්‍රතිපත්තිය ගැන චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරකසභාවේ තීරණය" විය. 1940 දෙසැම්බර් 25 වැනි දින මධ්‍යම කාරකසභාවේ නිර්දේශය "ප්‍රතිපත්තිය ගැන" යන ලිපිය වශයෙන් **මාඕ සේ-තුංගේ තෝරාගත් කෘති**, ii වැනි කාණ්ඩයෙහි ඇතුළත් කර තිබේ.

2. **ශියුක්යාඩි** යනු අධිරාජ විභාගයන්හි පහළම උපාධිය ලැබුවෙකි.

3. ජේ. වී. ස්ටැලින්, **ලෙනින්වාදයේ අත්තිවාරම**, 3 වැනි කොටස.

4. දස අවුරුදු සිවිල් යුද්ධයේ පළමුවැනි වකවානුව 1927 අන්තිම කොටසේ සිට 1928 අන්තිම කොටස තෙක් විය; එය සාමාන්‍යයෙන් චිංකාංශාන් වකවානුව නමින් ප්‍රකට ය; මැද වකවානුව 1929 මුල හරියේ සිට 1931කේ සරත් කාලය තෙක්, එනම් මධ්‍යම රතු කඳවුරු ප්‍රදේශය පිහිටුවීමේ සිට තුන්වැනි "වටලෑම සහ මර්දනය"ට විරුද්ධ ව්‍යාපාරය ජයග්‍රාහී ලෙස නිමවීම තෙක්, විය; අවසාන වකවානුව 1931 අවසාන හරියේ සිට 1934 අවසාන හරිය තෙක්, එනම් එකී ව්‍යාපාරයේ ජයග්‍රාහී නිමවීමේ සිට පක්ෂයේ මධ්‍යම කාරකසභාව විසින් කැඳවනු ලැබ ක්වෙයිචව් පළාතේ ත්සුන්යි නුවරදී පවත්වනලද දේශ–පාලන බියුරෝවේ විශාල කළ රැස්වීම තෙක්, විය. 1935 ජනවාරි මාසයේ ත්සුන්යි රැස්වීම 1931 සිට 1934 තෙක් පක්ෂය තුළ පැවති "වාම" අවස්ථාවාදී ක්‍රියාමාර්ගයේ ආධිපත්‍යය අවසානයකට පත්කොට, පක්ෂය නිවැරදි ක්‍රියාමාර්ගයට ආපසු හැරවී ය

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

- කෘතිය: ''ග්‍රාමීය සමීක්ෂණ''යට පෙරවදන හා පසුවදන
- කතෘ/පරිවර්තක: මාඕ සේතුං/-
- ප්‍රකාශක: ප්‍රජා ප්‍රකාශකයෝ, කොළඹ
- පළමු ඩිජිටල් පළ කිරීම: 2019-05-31
- ඩිජිටල් සංස්කරණයන්: V1:2019-05-29
- පිටු ගණන: 9
- භාෂා මාධ්‍ය: සිංහල
- ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com